**මානව සම්පත් අභිවර්ධන ආයතනය**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මතය**

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන 2011 දෙසැම්බර් 31 දිනට මානව සම්පත් අභිවර්ධන ආයතනයේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිලිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.2.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධිත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 02 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීමෙන් පසුව 2012 මැයි 14 දින කෙටුම්පත් වාර්තාව නිකුත් කරන ලදී. කෙටුම්පත් වාර්තාවේ රු.19,487,373 ක ගිණුම්කරණ අඩුපාඩු පෙන්වා දුන් අතර රු. 11,798,094 ක් වූ ගිණුම්කරණ අඩුපාඩු නිවැරදිකර සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2012 මැයි 31 දින ඉදිරිපත් කර තිබූ අතර රු. 7,689,279 ක ගිණුම්කරණ අඩුපාඩු තවදුරටත් නිරීක්ෂණය විය. තෝරාගන්නා ලද නියැදියෙන් බාහිරව තවදුරටත් මෙවැනි අඩුපාඩු තිබීම විගණනයේදී බැහැර කළ නොහැක.

1.2.2 **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත**

එක් වර්ෂයක් ඉක්මවා පැවැත්වෙන පාඨමාලා ආදායම් ගිණුම්ගත කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත අංක 29 අනුව ඒ ඒ වර්ෂවලට අනුරූපී ආදායම හඳුනාගෙන ගිණුම්ගතකළයුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී එවැනි පාඨමාලා 44 ක වියදම වූ රු.57,041,823 කට සමාන මුදලක් අදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

### 1.2.3 ගිණුම්කරණ අඩුපාඩු

අධ්‍යයන කටයුතු නිමව තිබූ පාඨමාලා 04 කට අදාල රු.7,689,279 ක් වූ අතිරික්තයන් ආදායම් හා වියදම් ගිණමට බැර කිරීම වෙනුවට මූල්‍ය ප්‍රකාශන වල ගෙවියයුතු (Payable) ශේෂයක් ලෙස දක්වා තිබුණි.

### 1.2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකුල නොවීම

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකුල නොවීම් අනාවරණය විය.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | විස්තරය |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකාණ්ඩුවේ මුදල් රෙගුලාසි 371 | සමාලෝචිත වර්ෂය අවසානයේදී විවිධ අත්තිකාරම් ගිණුමේ වූ රු.282,659 ශේෂයෙහි වසර 05 කට අධික කාලයක් හදුනා නොගත් ශේෂයක් ලෙස ඉදිරියට එන රු.197,829 ක ශේෂයක්ද 2006 වර්ෂයේ ලබාදී තිබූ රු.20,850 ක අත්තිකාරම්ද නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | මුදල් රෙගුලාසි 756 | වත්කම් පිළිබඳ වාර්ෂික සමීක්ෂණය කර ඊළඟ වසරේ ජනවාරි මාසය අවසන් වීමට ප්‍රථම සමීක්ෂණ මණ්ඩල වාර්තා ඉදිරිපත් කලයුතු වුවත් 2012 අප්‍රේල් 30 වන විටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| | මුදල් රෙගුලාසි 771 හා 772 විශ්ව විද්‍යාල ආයතන සංග්‍රහයේ XXVI පරිච්ජේදයේ 4 හා 5 | 2010 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිරීක්ෂණ අනුව විෂයයන් 98 ක් සම්බන්ධයෙන් අපහරණය කිරීමේ කටයුතු සිදුකර නොතිබුණි. |
| (ආ) | අංක UGC/IUA/2/PGS/6 හා 2009 ජුනි 03 දිනැති විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ | බාහිර කථිකාචාර්යවරුන් සඳහා එක් දේශන පැයක් වෙනුවෙන් වූ ගාස්තු රු.2,500 ක උපරිමයකට සීමාකර ඇතත් එකී නියමයන්ට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී රු.145,500 ක් ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2004 ජූලි 29 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/25 | රු.66,943,052 ක ආයෝජන සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

### 1.2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගණුදෙණු

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 29/98, 29/98(i), 07/2007(i) හා 02/2009 චක්‍රලේඛයට පටහැනිව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද ආයතන චක්‍රලේඛ ලිපි අංක 6/2003 අනුව දෙවන හා තෙවන භාෂා ප්‍රවීණතාවය වෙනුවෙන් වැටුප් හා දිරි දීමනා වශයෙන් සමාලෝචිත වර්ෂයේ රු.79,178 ක් ගෙවා තිබුණි.

## 2. මූල්‍ය ප්‍රතඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ ආයතනයේ මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵලය, පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන ගණන් ගැනීමට පෙර රු.24,747,283 ක ඌනතාවයක් වූ අතර, අනුරූප එම ඌනතාවය රු.18,098,126 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවයෙ රු.6,649,157 ක වැඩිවීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂය සඳහා රු.22,215,947 ක්වූ රජයේ දායකය හේතුකොට ගෙන වර්ෂය සඳහා ඌණතාවය රු.2,531,336 ක් දක්වා අඩුවූ අතර , ඉකුත් වර්ෂයේ රු.19,000,000 ක රජයේ දායකය හේතුකොට ගෙන එම වර්ෂයේ අතිරික්තය රු.901,874 ක් විය. සමාලෝචිත වර්ෂයේ ඌනතාවය වැඩිවීම සඳහා පුද්ගලික පඩිනඩි, සැපයුම් හා සේවා හා පාරිතෝෂික ආදී වියදම් ඉහලයාම විශේෂයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂය තුල ආයතනය විසින් පාඨමාලා 30 ක් ක්‍රියාත්මක කර තිබූ අතර ලියාපදිංචි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 11,951 ක් විය. මෙයින් පාඨමාල 15 ක් සමාලෝචිත වර්ෂය තුල ආරම්භ කරන ලද පාඨමාලා වූ අතර එම පාඨමාලා වල ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 3665 ක් විය. මේ සම්බන්ධයෙන පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි 1 හා 11 පාඨමාලා වල පළමු අර්ධ වාර්ෂික පරික්ෂණ හා දෙවන අර්ධ වාර්ෂික පරික්ෂණ විභාග පිළිවෙලින් 2011 ජුනි හා දෙසැම්බර් මාස වල පවත්වා තිබුණද පළමු අර්ධ වාර්ෂික පරීක්ෂණයේ ප්‍රතිපල නිකුත් කිරීම 2012 මැයි මාසය වන විට මාස 10 කින් ප්‍රමාද වී තිබූණි.

(ආ) Gioinformatic පාඨමාලා අංක 02 හ විභාග 2011 මැයි හා ජුනි මාස වල පවත්වා තිබූ අතර 2012 අප්‍රේල් 30 දින වන විටත් එම පාඨමාලා වල ප්‍රථිපල නිකුත්කර නොතිබූ අතර ඒ අනුව ප්‍රථිපල නිකුත් කිරීමේ ප්‍රමාදය මාස 10 ය ඉක්මවා තිබුණි.

**4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

-----------------------------------

**4.1 ක්‍රියාකාරී සැලැස්ම**

-----------------------

රාජ්‍ය ව්‍යවසායන්හි යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.1.2 පරිදි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමේදී එක් එක් කාර්යය සම්බන්ධයෙන් වගකීම එක් එක් නිලධාරීන් වෙත වෙන වෙනම පැවරෙන ආකාරයෙන් අදාල සැලැස්ම සකස් වියයුතු වුවත් ගොඩනැගිලි හා ආකෘති වර්ධනය කිරීම, ගෘහ භාණ්ඩ සහ ඉගැන්වීමේ උපකරණ මිලදී ගැනීම හා පොත් සහ සඟරා මිලදී ගැනීම යන කාර්යයන් සම්බන්ධයෙන් වගකීම නිශ්චය වන පරිදි සැලැස්ම සකස්කර නොතිබුණි.

**4.2 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

-------------------------------

ආයතනයේ 2008 , 2009 , 2010 වාර්ෂික වාර්තා 2012 මැයි 08 වැනි දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. 2010 වාර්ෂික වාර්තාව ඉහත දින වන විටත් සකස් කෙරෙමින් පැවතුණු අතර 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමග කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ අධ්‍යක්ෂක වෙත වරින් වර දන්වන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) අත්තිකාරම් පියවීම
(ආ) ගිණුම්කරණය
(ඇ) ස්ථාවර වත්කම් ලේඛනය